**8. ගාථාව**

**කුම්භූපමං කායමිමං විදිත්වා - නගරූපමං චිත්ත'මිදං ඨපෙත්වා,**
**යෝධේථ මාරං පඤ්ඤාවුධේන - ජිතං ච රක්ඛේ අනිවේසනෝ සියා.**

**පදගතාර්ථය**

| | |
|---|---|
| **ඉමං කායං** | - මේ සිරුර, |
| **කුම්භූපමං** | - මැටි කළයක් මෙනැ'යි, |
| **විදිත්වා** | - දැන, |
| **ඉදං චිත්තං** | - මේ සිත, |
| **නගරූපමං** | - (සුරක්ෂිත) නගරයක් මෙන් (ස්ථිර කොට), |
| **ඨපෙත්වා** | - තබා, |
| **පඤ්ඤාවුධේන** | - විදර්ශනා ප්‍රඥා නමැති ආයුධයෙන්, |
| **මාරං** | - කෙලෙස් මරුට, |
| **යෝධේථ** | - පහර දෙන්නේ ය, |
| **ජිතං ච** | - දිනන ලද්ද වූ විදර්ශනාව ද, |
| **රක්ඛේ** | - රැක ගන්නේ ය, |
| **අනිවේසනෝ** | - (ලෞකික සම්පත් නමැති) ලැගුම් ගෙයක් නැත්තෙක්, |
| **සියා** | - වන්නේ ය, |

**භාවාර්ථය**

මේ කය මැටි බඳුනක් මෙනැ'යි දැන, මේ සිත සුරක්ෂිත නුවරක් මෙන් තබා ගෙන, ප්‍රඥාව නමැති ආයුධයෙන් මරුහට පහර දෙන්නේ ය. ඉපිද වූ තරුණ විදර්ශනාව ද රක්නේ ය. ලෞකික සම්පත් කෙරෙහි ඇලුම් නො කරන්නේ ය.

**නිදාන කථාව**

සැවැත් නුවරවැසි පන්සියයක් පමණ භික්ෂූන් වහන්සේලා බුදුරජාණන් වහන්සේ වෙතින් රහත් බව දක්වා කමටහන් උගෙන මහණදම් පුරන්නෙමු' යි සිතා යොදුන් සියයක් පමණ දිගුමග ගෙවා එක් ජනාකීර්ණ වූ ගමකට පැමිණියාහ. ඒ ගම්වැසියෝ භික්ෂූන් වහන්සේලා දැක අසුන් පනවා, වඩාහිඳුවා රසවත් බත්, කැඳ ආදිය වළඳවා "කොතැනක වඩින්නහු ද" යි කියා ඒ භික්ෂූන්ගෙන් විචාළාහ. ය. "වස් විසීමට පහසු ඇති තැනක් සොයා යන්නෙමු" යි කියා භික්ෂූන් වහන්සේලා පැවසූ කල්හි ඒ ගම්වැසියෝ "ස්වාමීනී, මේ තෙමස මෙහි වසනු මැනව. අපි ඔබ වහන්සේලා වෙතින් තිසරණ සහිත වූ සිල් සමාදන් වන්නෙමු" යි කීහ. භික්ෂූන් වහන්සේලා එම ආරාධනාව ඉවසූහ.

ගම්වැසියෝ ඒ බව දැන ගමට නුදුරු එක් වන ලැහැබක රාත්‍රී ස්ථාන - දිවා ස්ථාන - වැසිකිළි ආදිය පිළියල කොට භික්ෂූන් වහන්සේලාට පැවරූහ. වනලැහැබෙහි අරක්ගත් දෙවියෝ "සිල්වත් භික්ෂූන් වහන්සේලා මේ වනලැහැබෙහි වසද්දී ගස් නැගී විසීම අපට නුසුදුසු යැ" යි බිමට බැස 'මේ හිමිවරු අද රෑ පමණක් මෙහි සිට හෙට යනු ඇතැ' යි සිතූහ. භික්ෂූන් වහන්සේලා පසුද ගමට ගොස් වන ලැහැබට ම පැමිණියහ. එවිට දෙවියෝ 'මේ භික්ෂූන් වහන්සේලාට කවුරුන් විසින් නමුත් හෙට දිනටත් ආරාධනා කරන්නට ඇත. ඒ නිසා නැවත මෙහි ආහ. අදත් මෙහි සිට හෙට නික්ම යනු ඇතැ' යි සිතූහ. මේ ලෙසින් ඔවුහු අඩමසක් බිම හුන්හ. 'මේ හිමිවරුන් මෙම තෙමස ම මෙහි වැඩ සිටින සේ ය. එසේ නම් අප ගස්වල ඇති විමානයන්හි හිඳීම නුසුදුසු ය. එහෙයින් කිසිවක් කොට මෙම භික්ෂූන් පිටත් කළ යුතු ය' යි සිතා දෙවිවරු එයට උපායක් යොදන්නාහු. ඒ ඒ සෙනසුන්වල වෙන් වෙන් ව විදසුන් වඩන භික්ෂූන්ට කපා දැමූ හිස් ද හිස් සුන් සිරුරු ද මවා දක්වති. අමනුෂ්‍යයන් මෙන් බිහිසුණු හඬ නංවති. තැති ගැන්වීමට වෙර දරති. මේ ගැහැට වැඩි වෙත් ම භික්ෂූන් වහන්සේලා කලකිරුණාහ. රෝගාතුර ද වූහ. ඒ භික්ෂූහු "ඇවැත්නි, ඔබ වහන්සේලා ලෙඩින් පෙලෙන්නා සේ පෙනෙත්. ආබාධය කුමක් ද" යි කියා එකිනෙකාගෙන් ඇසූහ. "මට කැස්ස"; "මට කිඹිසිලි යෑම" යි මෙලෙසින් තම තමන්ට වැළඳී තිබූ අසනීප කියා "සක්මන් කෙළවර දී සිරුරක් නැති ඔළුවක් දිටිමි"; "

මම ඔළුව නැති සිරුරක් දුටිමි"; "මට වැසිකිළිය අසල දී අමනුෂ්‍ය ශබ්දයක් ඇසිණි" යි එකිනෙකා කී කල්හි කවුරුත් "අපට මේ ස්ථානය හිතකර නො වේ. අපහසුකම් බොහෝ ය. එහෙයින් බුදුරජුන් වෙත යමු" යි සමසිත් ඇති ව බුදුරජාණන් වහන්සේ වෙත ගොස් වැඳ සිටියහ. බුදුරජාණන් වහන්සේ " මහණෙනි, නුඹලා මෙපමණ ඉක්මනින් පෙරළා වැඩම කළේ කිමදැ" යි ඇසූහ.

භික්ෂූන් වහන්සේලා සියලු තොරතුරු බුදුරජාණන් වහන්සේට දැනුම් දුන් කල්හි බුදුරජාණන් වහන්සේ "මහණෙනි, එහි ම වැඩම කරන්නැයි" යි කී සේක. භික්ෂූහු එහි යාමට නො හැකි බව කීහ.

"මහණෙනි, නුඹලා පළමුවර එහි හිස් අතින් ගියාහු ය. මෙවර ආයුධයක් ගෙන යන්නැ" යි මෙත්ත සූත්‍රය උගන්වා නැවත "මහණෙනි, විහාරයෙන් පිටත වන ලැහැබෙහි පටන් සජ්ඣායනා කරමින් වනයට ඇතුළු වන්නැ" යි කියා නියම කළ සේක. භික්ෂූන් වහන්සේලා "එසේ යැ" යි කියා පිළිතුරු දී බුදුරජුන් වැඳ එතැනින් නික්ම මෙත්ත සූත්‍රය සජ්ඣායනා කරමින් වනයට පිවිසියහ.

වන ලැහැබෙහි හුන් දෙවියෝ මෙත් සිත් ලබා පෙර ගමන් කොට පාත්‍ර සිවුරු ඉල්ලූහ. ඒ ඒ තැන රැකවල් ගත්හ. උණු දෙයක් දියෙහි ලූ කලෙක මෙන් ඒ සියලු උවදුරු සන්සිඳුනේ ය. අමනුෂ්‍ය ශබ්දය නැති ව ගියේ ය. එහෙයින් එම භික්ෂූන් වහන්සේලාගේ සිත් එකඟ විය. ඔවුහු රාත්‍රී ස්ථාන - දිවා ස්ථානවල හිඳ විදර්ශනාවෙහි යෙදුනාහ. 'මේ ආත්මභාවය බිඳෙනසුලු ය, අස්ථිර ය, මැටි බඳුනක් සේ ය' යි යනුවෙන් විදසුන් වැඩූහ. බුදුරජාණන් වහන්සේ ගන්ධ කුටියෙහි වැඩහුන් සේක්. භික්ෂූන් වහන්සේලා විදර්ශනාව පටන් ගත් බව දැන ඔවුන් අමතා "මහණෙනි, මේ ආත්මභාවය බිඳෙනසුලු ය, අස්ථිර ය, මැටි බඳුනක් බඳුය" යි වදරා ආලෝකයක් පතුරුවා යොදුන් සියයකින් ඈත වැඩ සිටියත් ඉදිරියෙහි හුන්නකු සේ සවනක් රැස් විහිදුවා පෙනෙන රූපයෙන් යුක්ත ව ඉහත ගාථාවෙන් ධර්ම දේශනා කළ සේක. දේශනාව කෙළවර භික්ෂූන් වහන්සේලා පන්සියනම ම චතුපටිසම්භිදා සහිත ව අරහත්වයට පත් වූහ.

**සාධු ! සාධු !! සාධු !!!**

**ශ්‍රී සද්ධර්ම සංසදය**
**ධම්මාරාම යෝගාශ්‍රමය**
**(බිනර 2551)**


<u>**සම්පාදක:**</u> පොල්ගස්ඕවිට විපස්සනා භාවනා මධ්‍යස්ථානවාසී
පූජ්‍ය පිළියන්දල අතුලසිරි ස්වාමීන් වහන්සේ.

<u>**පිටු සැකසීම:**</u> පින්වත් පුණ්‍ය ශ්‍රී තුෂන්ත උපාසක මහතා.

<u>**ධර්මදානය:**</u> පින්වත් දයාසීලී උපාසිකා මාතාව හා උපේක්ෂා පියරංගිකා මෙනෙවිය විසින් අභාවප්‍රාප්ත ඥාතීන්ට පුණ්‍යානුමෝදනා කිරීම පිණිසත් තමන්ට ධර්මාවබෝධය පිණිසත් මෙම ධර්මදානය සිදු කරන ලදී.


❖ *අතිපූජනීය නා උයනේ අරියධම්ම ස්වාමීන්දයන් වහන්සේගේ ධර්ම දේශනා ඇතුළු පටිගත කරන ලද ධර්ම දේශනා සහ පසුගිය දහම් ලිපි* **www.sadaham.net** *යන වෙබ් අඩවිය ඔස්සේ ලබා ගත හැකි ය.*


**Copyright © Sri Saddharma Sansadaya, Dhammarama Yogashramaya - 2007**